කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව.

කුරුණෑගල දිස්ත්‍රික්කය

-------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 29 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 07 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 09 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි වැඩසටහනෙහි සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන වැය රු.16,295,500 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.18,137,760 ක් ලෙස රු.1,842,260 ක් වැඩියෙන් ගෙන තිබුණු අතර, වර්ෂයට අදාල ප්‍රාග්ධන ආධාර රු.2,659,870 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ). සභාව සතු ගොඩනැගිල්ලක් බාහිර පාර්ශවයකට පැවරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල ලද රු.6,458,421 ක මුදලක් ප්‍රාග්ධන ආදායම් යටතට නොගෙන පුනරාවර්තන ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම එම වත්කමේ පොත් අගය වූ රු.630,000 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම හා ස්ථාවර වත්කම් ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ). වර්ෂයට අදාල උසාවි දඩ ආදායම රු.2,707,744 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.3,500,000 ක් ලෙස රු.792,256 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(ඈ). ගිණුම් උපලේඛන අනුව වර්ෂය අවසානයට ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු. 24,710,238 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.24,046,048 ක් ලෙස රු.664,190 ක් අඩුවෙන් ගෙන තිබුණි.

(ඉ). වර්ෂය අවසානයට තැන්පතු ශේෂය රු.3,040,689 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.2,287,672 ලෙස රු.753,017 ක් අඩුවෙන් ගෙන තිබුණි.

1.3.2 <u>අසම්භාව්‍ය බැරකම්</u>

ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයන්ට අදාලව සභාව විසින් එම අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.495,632 ක්ව තිබුණි .

1.3.3 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂයට අදාලව බිල් කිරීම්, ලැබීම් හා ආරම්භක ශේෂය යටතේ ගිණුම් විෂයයන් 14 ක ගිණුම අනුව හා අදාල ලේඛන අනුව අනුරූපී අගයන් අතර රු. 2,690,969 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.20,224,092 ක් වූ අතර, එයින් රු.4,185,330 ක් වසරකට වඩා පැරණි ශේෂයන් විය.

(ආ). 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.21,446,545 ක් වූ අතර, එයින් රු. 2,545,862 ක් වසරකට වඩා පැරණි ශේෂයන් විය.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 7,731,769 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

1.3.6 <u>අධිකාරි බලය නොලත් ගනුදෙනු</u>

සමාලෝචිත වර්ෂය තුල ගිණුම් විෂයයන් 6 ක ගිණුම් ශේෂ හා ඒවාට අදාල ලේඛන ශේෂ සමාන කිරීම සඳහා අවස්ථා 4 කදී රු.2,691,972 ක් සමුච්චිත අරමුදලට හරකර තිබුණු අතර අවස්ථා 02 කදී රු.1,631,791 ක් සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. මේ සඳහා විධිමත් විමර්ශණයක් කර නොතිබුණු අතර විධිමත් අනුමැතියක්ද ලබාගෙන නොතිබුණි.

02. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,854,948 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.683,497 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,171,451 ක වර්ධනයක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.23,695,530 ක් වූ ප්‍රාග්ධන ආදායම් හා රු.28,301,855 ක් වූ ප්‍රාග්ධන වියදම් ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල අතිරික්තය රු.2,248,623 දක්වා අඩුවී තිබුණි.

2.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.31,359,108 න් සියයට 89 ක් ලෙස රු.27,813,516 ක මුදලක් උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.23,695,530 න් සියයට 58 ක් ලෙස රු.13,635,630 ක මුදලක් ගමනැගුම, වයඹ පුබුදුව වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන වියදම වූ රු.24,504,160 න් සියයට 69 ක් ලෙස රු.16,829,409 ක් පෞද්ගලික පඩිනඩි වියදම වූ අතර, ඉන් සියයට 84 ක් ලෙස රු.14,103,238 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.28,301,855 න් සියයට 64 ක් වූ රු.18,137,760 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතන ප්‍රතිපාදන වලින් ඉටුකල සංවර්ධන කාර්යයන් සඳහා වැය වී තිබුණු මුදල් විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු, කඩකුලි, බදුකුලි වැනි ආදායම් ක්ෂේත්‍රයේදි එකතු කිරිම සඳහා නිශ්චිත බලයක් නොතිබුණ ද, සභාවේ ආදායම් එකතු කරන්නන් විසින් වර්ෂය පුරාම වරිපනම් බදු හා වෙළඳ බලපත්‍ර වැනි ආදායම් ද ක්ෂේත්‍රයේදි එකතු කර තිබුණි.

2.3.2 වරිපනම් බදු

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 32-42 දක්වා වූ රීතින් ප්‍රකාරව කාර්තු පදනම් කරගෙන හිඟ ලැයිස්තු සකස් කර, අදාල නිවේදන නිකුත් කිරීමෙන් පසු දේපල තහනමට ගෙන හිඟ වරිපනම් බදු අයකිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කල යුතු විය. එහෙත් හිඟ ලැයිස්තු සකස් කිරීම වෙනුවට වරිපනම් ලේඛනයේ පිටු ඡායා පිටපත් කර වරෙන්තුවකින්ද තොරව ක්ෂේත්‍රයේ මුදල් එකතු කිරීමට කටයුතු කර තිබුණි. එලෙස සභාව විසින් වීථි 2 කට අදාලව රු.100,789 ක හිඟ සඳහා අවසන් නිවේදන 30 ක් බෙදාහැර තිබූ අතර ඉන් ඒකක 23 කින් රු.66,227 ක් අයකර තිබුණි.

2.3.3 ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 59 - 67 දක්වා ඇති පරිදි සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) හා 152(1) වගන්ති ප්‍රකාරව, කර්මාන්ත හිමියන් හා වෙළඳ ව්‍යාපාරිකයන් වෙත දින 7 ක් ඇතුලත පනවන බද්ද ගෙවන ලෙස නියම කරමින් ප්‍රා.ස. 26 B ආකෘතිය ප්‍රකාරව නිවේදනය කර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). කොබෙයිගනේ පොලීසිය පවත්වාගෙන යනු ලැබූ සභාවට අයත් ඉඩම පොලීසිය සඳහා පවරා දී තිබුණද, එලෙස සභා සතු දේපල පැවරීම සඳහා නෛතික විධිවිධාන පැවරී ඇති බවක් නිරීක්ෂණය නොවීය. තවද මේ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුවක් ලබා ගෙන නොතිබුණු අතර, පළාත් පාලන දෙපාර්තමේන්තුවද දැනුවත් කර නොතිබුණි. 2010 වර්ෂයට අදාල රු.5,000,000 තක්සේරුවක් පදනම් කරගෙන ප්‍රමාද දඩ ගාස්තුද සමඟ රු.6,458,421 ක මුදලකට අදාල දේපල 2013 වර්ෂයේදී පොලීසිය වෙත පවරා දී තිබුණි. එමෙන්ම මෙලෙස ලද මුදලින් රු.2,500,000 ක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඇති අතර ඉතිරි රු.3,958,421 ක ප්‍රමාණයම සභාවේ එදිනෙදා පරිපාලන කටයුතු සඳහා යොදවාගෙන තිබුණි.

(ආ). සභාව විසින් 2008 - 2011 කාලය තුල අනුමත කල ගොඩනැගිලි අයදුම්පත් 114 සඳහාම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අනුකූලතා සහතික ලබාගෙන නොතිබුණි. එසේම ගොඩනැගිලි බලපත්‍රය දීර්ඝ කරවා නොගැනීම පිළිබඳව හෝ අනුකූලතා සහතික නොමැතිව එම ගොඩනැගිලි ප්‍රයෝජනයට ගැනීමට එරෙහිව හෝ සභාව විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබු අතර, අනුකූලතා සහතික ගාස්තු හා ප්‍රමාද ගාස්තු අයකිරීම පිළිබඳව විධිවිධානද සභාව විසින් ඇතිකරගෙන නොතිබුණි

04. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

4.1 <u>අයවැය ලේඛනමය පාලනය</u>

සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛනය මගින් රු.26,523,000 ක පුනරාවර්තන ආදායමක් හා රු.49,500,000 ක ප්‍රාග්ධන ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද, එයින් එකතු කර තිබුණේ පුනරාවර්තන ආදායමෙන් සියයට 20 ක් ලෙස රු.5,568,000 ක් හා ප්‍රාග්ධන ආදායමින් සියයට 64 ක් ලෙස රු.31,714,000 ක් පමණි.

05. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අයවැය පාලනය

(ඇ). මූල්‍ය පාලනය

(ඈ). ආදායම් පරිපාලනය

(ඉ). ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම